# ජීවන පෙරළිය

හානිපූර්ණය පිළිබඳ කාන්තා

සිතැඟි එකතුව

# පෙරවදන

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය, යුද්ධයෙන්, දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් සහ නොසන්සුන්තාවයෙන් පීඩාවට පත්වූ ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ සහ මුස්ලිම් කාන්තාවන්ට හානිපූරණයන් වෙත ප්‍රවේශය පහසු කිරීම සඳහා කටයුතු කරයි. හානිපූරණය සඳහා ප්‍රවේශ වීමට හා ඒවා ලබාගැනීමට අවශ්‍ය දැනුම ලබාදීමට හා හැකියාව ඇති කිරීමට අපි ප්‍රජා කාන්තාවන්, සිවිල් සමාජ සංවිධාන සහ අනෙකුත් කාන්තා සාමූහිකයන් සමඟ කටයුතු කරන්නෙමු. හානිපූරණ ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණ හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී හා වඩාත් අන්තර්ගෘහිත ප්‍රවේශයක් සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ කෙරෙහි බලපෑම් කිරීම සඳහා සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය රාජ්‍ය අංශය සමඟ ද කටයුතු කරයි. මෙම ප්‍රකාශනයේ දැක්වෙන ඡායාරූප එකතුව කාන්තාවන්ට අර්ථවත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී හානිපූරණයන් සඳහා වඩා හොඳ ප්‍රවේශයක් ලබා ගැනීමේ අරමුණින් ප්‍රජා කාන්තාවන්, සිවිල් සමාජ සංවිධාන සහ හානිපූර්ණය සඳහා වන කාර්යාලය සමඟ පැවැත්වූ විවිධ ධාරිතා වර්ධන සැසි සහ සාකච්ඡා වලින් ලබාගත් ඒවා වේ.

මෙම ප්‍රකාශනයේ දැක්වෙන වැඩමුළු සහ සාකච්ඡා පැවැත්වුනේ 2019 අගෝස්තු සිට 2021 අප්‍රේල් දක්වා වූ කාලසීමාව තුළ දීය. මෙම ප්‍රකාශනයේ පරමාර්ථය නම්, අදාළ අංශවල සෙසු පුද්ගලයන් ප්‍රජා මට්ටමේ මැදිහත් වීම් සහ කාන්තාවන්ගේ හානිපූරණ අවශ්‍යතාවය වෙනුවෙන් පෙනී සිටීම සඳහා සම්බන්ධ වීම උනන්දු කරවීමේ අරමුණින් පසුගිය වසර කිහිපය තුළ සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් දේශීය, ජාතික හා ප්‍රතිපත්තිමය මට්ටම්වල මැදිහත් වීම් වාර්තා කිරීමය.

**ශ්‍යාමලා ගෝමස්**
**විධායක අධ්‍යක්ෂිකා**
**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**
**2021 ජූලි**





Counter Point: තම කලාකෘතිය ඉදිරිපත් කිරීමට පෙර කණ්ඩායමේ සගයන් අතර අදහස් හුවමාරු කරගන්නා අවස්ථාවක්.



Concentrated Effort: කාන්තාවක් තම කණ්ඩායමේ කලා කෘතිය නිර්මාණය කරන අතරතුර මිනුම් සඳහා කඩදාසි භාවිතා කරන අවස්ථාවක්.



කාන්තා අයිතිවාසිකම් සහ පරතරයන් අවම කිරීම සඳහා තමන්ට ඉදිරිපත් විය හැක්කේ කෙසේද යන්න පිළිබඳ සිවිල් සමාජ සංවිධාන වල සේවය කරන අය සඳහා පුහුණු සැසියක්.

# දිවි ගලවාගත් අයට ලබාදෙන හානිපූර්ණ විධි මොනවාද?


An eye for detail: තම කලාකෘතියේ අංගයක් වශයෙන් කුඩා රුවක් සඳහා ඇඳුමක් නිර්මාණය කරන කාන්තාවන්.



දිවි ගලවා ගත් බොහෝ දෙනෙක් තම දෛනික ආදායම් මාර්ගය වූ සැමියා, පියා සහ සහෝදරයන් අහිමි වූ අය වන බැවින් කාන්තාවන් සඳහා ස්වයං රැකියා කුසලතා සහ පුහුණුව ලබා දීම වැදගත් වේ.

කෙසේ වෙතත්, නිපුණතා සපයන්නන් විසින් කාන්තාවන්ට ලබා ගත හැකි හෝ ලබා දෙන විකල්පයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රීය කරගත් ඒවා වේ. උදා. සූපශාස්ත්‍ර පාඨමාලා, හිසකෙස් සහ රූපලාවණ්‍ය පාඨමාලා.

**ජාතික මට්ටමින් ගත්කල කාන්තාවන්ට ලබා දෙනුයේ පරිපාලන හෝ ලිපිකරු රැකියා අවස්ථා පමණක් වන අතර මෙය අවධානය යොමු කළ යුතු ගැටලුවක් ලෙස සැලකේ.**




“Ratio Decidendi”: කාන්තාවන් තම අයිතිවාසිකම් ලබාගැනීම සඳහා භාවිතා කළ යුතු පැමිණිලි යාන්ත්‍රණයන් විධිමත් කිරීම පිළිබඳව සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය අංශයේ නියෝජිතයින් අදහස් ඉදිරිපත් කරන අවස්ථාවක්.



Silent Figures: කාන්තාවන් මුහුණ දෙන සමාජ හා සංස්කෘතික යථාර්ථයන් නිරූපණය කරන කලාකෘතියකි.

**පශ්චාත් කම්පන තත්ත්වය හේතුවෙන් බොහෝ හමුදා පවුල් වල ගෘහස්ථ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ඉහළ යාමට හේතු වී ඇති හෙයින්,**

යුද්ධයෙන් පසු නැවත නිවසට පැමිණි සිය සැමියන් පුනරුත්ථාපනය කිරීමේ අවශ්‍යතාවය කුරුණෑගල ප්‍රදේශයේ හමුදා භාර්යාවෝ ප්‍රකාශ කළහ.

හානිපූරණය භෞතික අවශ්‍යතාවලට පමණක් සීමා වන අතර මනෝ සමාජයීය රැකවරණයක් ඉන් නොලැබෙන බව එක් සහභාගිවන්නියක් සඳහන් කළ අතර, රට තුළ හානිපූර්ණය සඳහා වන කාර්යාල ඇත්තේ සීමිත ප්‍රමාණයක් බවත්, පීඩාවට පත් වූවන්ට පිළියම් ලබාගැනීම සඳහා ඒවාට ලඟා වීම ඉන් දුෂ්කර වන බවත් තවදුරටත් අදහස් දක්වන ලදී.

## නීතිය මිනිසුන්ගේ අවශ්‍යතා සමඟ පරිණාමය විය යුතු යැයි ඔවුහු විශ්වාස කරති.

## මියගියවුන් ගෞරවාන්විතව අනුස්මරණය කිරීම,

උල්ලංඝනය කිරීම් පිළිබඳව වැඩි විස්තර ලබාගැනීම, රැකියා අවස්ථා, ව්‍යුහාත්මක අසමානතා වලට පිළියම් යෙදීම, ආර්ථික හා අධ්‍යාපනික සහාය, මුහුණදුන් උල්ලංඝනයේ බරපතලකම මත පදනම්ව සුදුසු සහ ප්‍රමාණවත් ලෙස මුදල් වන්දි ලබාදීම යනාදිය බලධාරීන්ගෙන් කාන්තාවන් බලාපොරොත්තු වන පිළියම් කිහිපයක් වේ.



Quiet Reflection: වැඩිහිටි පරම්පරාව විසින් විස්තර කරන කතා තුළින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය අවබෝධ කර ගැනීමට උපකාරී වන වැඩමුළුවකට යෞවනයන් සහභාගී වූ අවස්ථාවක්.



Clarity: කාන්තාවන් හා හානිපූරණයන් පිළිබඳ ඔවුන්ගේ කලා කෘති වලට ජීවය ලබාදීමට කාන්තාවන් සමඟ කටයුතු කරන සම්පත් දායිකාවක්.

1988 කැරැල්ලේදී ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ) විසින් මගේ පියා ඝාතනය කළා. ඔහු රාත්‍රී 7.00 ට කඩයකට ගිය අතර ආපසු ආවේ නෑ. මධ්‍යම රාත්‍රියේ පමණ මගේ මව සහ සහෝදරිය ඔහු සොයා ගියා. ඔහුගේ මළ සිරුර කාණුවක තිබී ඔවුන්ට හමුවුණා. ඔහුට තුන් වතාවක්ම වෙඩි වැදී තිබූ අතර ඔහුගේ බෙල්ල සහ කට කපා දමා තිබුණා.

**අපේ පියා අහිමි වීමේ වේදනාව තවමත් මටත් මගේ සහෝදර සහෝදරියන්ටත් දැනෙනවා. අපට කිසිම හානිපූරණයක් ලැබී නෑ.**

- කාන්තා ප්‍රජා නියෝජිත, හම්බන්තොට



Caged Aspirations: කාන්තාවන් මුහුණ දෙන සමාජ හා සංස්කෘතික යථාර්ථයන් නිරූපණය කරන කලාකෘතියකි.

First Steps: හානිපූර්ණය පිළිබඳ ඔවුන්ගේ සිතුවිලි නිරූපණය කරමින් ඔවුන්ගේ කලාකෘති නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පරීක්ෂා කරන කාන්තාවන්.



**අපට අවශ්‍ය අපේ අතුරුදන් වූවන් ආපසු ලබා දීමයි.**

වන්දි වශයෙන් අපට මුදල් අවශ්‍ය නැහැ.

මේ අය දැන් අප සමඟ සිටියා නම්, රජය වන්දි වශයෙන් දෙන ඕනෑම දෙයකට වඩා ඔවුන් අප වෙනුවෙන් ඉපැයීමට ඉඩ තිබුණා.

- කාන්තා ප්‍රජා නියෝජිත, කිලිනොච්චිය.

> **සිදු වූ දේ පිළිබඳ රජය විසින් ප්‍රසිද්ධියේ සමාව අයැදීමත් නැවත කිසිදා එය යළි සිදු නොවන බවට වන සහතිකයක් ද අපට අවශ්‍යයි.**

- කාන්තා ප්‍රජා නියෝජිත, කිලිනොච්චිය.

> **හානිපූරණ ලබා ගැනීමට හැකියැයි අප සිතන්නේ නැත.**
>
> එබැවින් කුමන ආකාරයේ වන්දි ලබා ගත හැකිද යන ප්‍රශ්න වලට පිළිතුරු දීමෙන් පලක් නැතැයි අපට හැඟේ.

- කාන්තා ප්‍රජා නියෝජිත, අම්පාර

අමුත්තන් ප්‍රජා කාන්තාවන් විසින් නිර්මාණය කරන ලද සිතුවම් නිරීක්ෂණය කරමින් සිටින අවස්ථාවක්.





සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය සිය සොයා ගැනීම් සහ කාන්තාවන්ගේ අදහස් හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ කොමසාරිස්වරයෙකු වෙත ඉදිරිපත් කරමින් සිටින අවස්ථාවක්.






The deceptive veil: සහභාගිවන්නියක් තම කණ්ඩායම විසින් නිර්මිත කලාකෘතියක් මගින් තම කණ්ඩායම අදහස් කිරීමට බලාපොරොත්තු වූ දේ පැහැදිලි කරන අවස්ථාවක්.



A few final touches: සහභාගිවන්නෙකු තම කලාකෘතිය ඉදිරිපත් කරන්නේ කෙසේදැයි තම සගයින්ට විස්තර කරන අවස්ථාවක්.

ප්‍රචණ්ඩත්වය හේතුවෙන් කාන්තාවන් වඩාත් අවදානමට ලක්විය හැකි අතර සාපේක්ෂව බොහෝ ගැටලු වලට ඔවුන්ට මුහුණ දීමට සිදු වන බැවින්,

**යුද්ධයෙන් හෝ දේශපාලන නොසන්සුන්තාවයෙන් පීඩාවට පත් වූ සියලුම කාන්තාවන්ට හානිපූරණයන් ලබා දිය යුතුය.**

හානිපූරණය මගින් කාන්තාවන්ට තවදුරටත් ප්‍රචණ්ඩත්වයට මුහුණ දීම වළක්වා ගත හැකිය. මම හිතන්නේ හානිපූරණයෙන් යම් තරමකට සමාජ අපකීර්තියට පිළියම් යෙදිය හැකි බවයි.

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

මම විශ්වාස කරන්නේ යුද්ධය හේතුවෙන් දෙමාපියන් අහිමි වූ දරුවන්ට හානිපූරණ ක්‍රමයක් ලෙස අධ්‍යාපනය ලබා දිය යුතු බවයි.

**අධ්‍යාපනය නොමැතිව ජීවිතයට අරුතක් නැති අතර වැඩිදුර ඉගෙනීමට නොහැකි වීම ගැන මම කනගාටු වෙමි.**

මගේ අත්දැකීම් මනෝවිද්‍යාත්මකව මට බලපා ඇති බව මම දන්නා අතර යුද්ධයේ සාහසික ක්‍රියාවලින් පීඩාවට පත් වූවන්ට චිත්තවේගී පුනරුත්ථාපනය ලබා දීම සඳහා මනෝ සමාජීය ආධාරක සේවා සහ ප්‍රජා මධ්‍යස්ථාන නිර්මාණය කිරීම උපකාරී වනු ඇතැයි මම විශ්වාස කරමි.

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

## “හානිපූරණය සාමූහික හා සාක්ෂාත් කරගත හැකි විය යුතු යැයි මම විශ්වාස කරමි.

මා විසින් ජීවිතයේ අත්විඳි හා මට නැති වූ දේ සඳහා හානිපූරණය කිරීමට නොහැකි වුවද රජයට මුදල් වන්දි ලබා දිය හැකි නම් අධ්‍යාපනික හා ජීවනෝපාය වියදම් පියවා ගැනීමටත් අප වැනි පීඩාවට පත් වූ අනෙක් අයට උපකාර කිරීමටත් අපට හැකි වනු ඇත.

ලබා දෙන හානිපූරණයෙන් අපේ ජීවන තත්ත්වය උසස් කරගත හැකි නම් යම් මට්ටමක සතුටක් හා තෘප්තියක් ලැබෙනු ඇත.”

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

## “හානිපූරණ ලැබීම වින්දිතයින්ට සාමකාමී හැඟීමක් ඇතිකිරීමට සහ ඔවුන්ට ඇතිවූ අපකීර්තියෙන් මිදීමට සහාය වේ.

යුද්ධයේදී සිදු වූ උල්ලංඝනයන් සම්බන්ධයෙන් වන කිසිදු නීතියක් ගැන මා නොදන්නා නමුත් නැවත එවැන්නක් ඇති නොවීම සහතික කිරීම සඳහා කොමිසමක් පිහිටුවිය හැකි යැයි මම විශ්වාස කරමි. සමස්ත සුව කිරීමේ ක්‍රියාවලියට හානිපූරණය දායක විය හැකි බව මගේ අදහසයි.”

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

Loud colours: ප්‍රජා කාන්තාවන් බලාපොරොත්තුවේ පණිවිඩය සහ සාමය සඳහා වූ ඔවුන්ගේ අභිලාෂයන් සහිතව තමන් විසින් පින්තාරු කල සාරියක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක්.




කාන්තාවන් සහ හානිපූරණය යන තේමාව යටතේ තම කලාකෘතිය සඳහා පදනම සකස් කරන කණ්ඩායමක් ඒ පිළිබඳ කටු සටහන් සකසන අවස්ථාවක් .



හානිපූරණයන් ඉල්ලා සිටින අයට පිළිතුරු ලැබීමේ මදබව පෙන්වන 'නිහැඬියාව' - කලාකෘතියේ නිමැවුම්කරුවන්









Character Building: හානිපූර්ණය  සඳහා වන කාර්යාලයේ ඇතැම් සේවකයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන මාතෘකාව සහ එය ඔවුන්ගේ වැඩවලට අදාළ වන්නේ කෙසේදැයි ගවේෂණය කිරීමේදී රූකඩ සාදන අවස්ථාවක්.

Lift Off: කලාකෘති වලට සෙමෙන් ජීවය ලබාදීම





Propped up: තම කණ්ඩායමේ කලාකෘතිය තැනීම සඳහා කාඩ්බෝඩ් කුඩුවක් සකස් කරන කාන්තාවන් දෙදෙනෙක්.

Back to the Drawing Board: කලාකෘති නිර්මාණය සඳහා කණ්ඩායම් වශයෙන් වැඩ කිරීමේ දී ඇතිවන සුළු පසුබෑම් වලට මුහුණ දීම

Puppets and Reparations: හානිපූර්ණය  සඳහා වන කාර්යාලයේ ඇතැම් සේවකයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන මාතෘකාව සහ එය ඔවුන්ගේ වැඩවලට අදාළ වන්නේ කෙසේදැයි ගවේෂණය කිරීමේදී රූකඩ සාදන අවස්ථාවක්.

“ජනවාර්ගික භේදයකින් තොරව මිනිසුන්ට හානිපූරණය කිරීම රජයේ වගකීමක් වන අතර,

**එසේ කිරීමේදී වැඩිහිටි පුද්ගලයින්, ගැබිනි කාන්තාවන්, වැන්දඹු කාන්තාවන් සහ කාන්තාවන් ගෘහ මූලිකයන් වන පවුල් වැඩි අවධානමකට මුහුණ දෙන බැවින් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු යැයි මම විශ්වාස කරමි.**

තවද, මුදල් වන්දි ලබා දීමේදී නිවසක සමස්ත තත්ත්වය සලකා බැලිය යුතු අතර එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය පසුවිපරම් කිරීමට රජය විසින් පියවර ගත හැකිය.”

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම



තම කණ්ඩායමේ සාරියට රටා සැලසුම් කරන කාන්තාවන්.



Proofreading: සාරි පින්තාරු කිරීමේ වැඩමුළුවකදී තම කණ්ඩායමේ සාරියේ ඇඳ ඇති බලාපොරොත්තුව දල්වන වචන පරීක්ෂා කරන කාන්තාවන්.



'කුඩුකල ප්‍රාර්ථනාවන්' - කලාකෘතියේ නිමැවුම්කරුවන්.

“ගැටුම් හේතුවෙන් විසිරී සිටි මිනිසුන් එකට එකතු කර සංහිඳියාව ඇති කරන ප්‍රජාව සඳහා වූ පුළුල් හානිපූරණයක් තිබේ නම් මම කැමතියි. ආගමික වතාවත් මගින් ද ඊට සහායක් ලැබිය හැකිය.

අතුරුදන්වූවන් හා මියගිය අය සඳහා ස්මාරක තැනීමට, ඔවුන්ගේ නමින් පාරවල් නම් කිරීමට, ප්‍රජා මධ්‍යස්ථාන සහ පුස්තකාල ඉදි කිරීමට ද ඔවුන්ට හැකිය

විපතට පත් වූවන්ගේ පවුල් එකට එකතු වී තම සමීපතමයන් සිහිපත් කළ හැකි අනුස්මරණ දිනයක් යොදා ගැනීමට ඔවුන්ට හැකිය.”

“සියළුම හානිපූරණයන් දිගු කාලීන විසඳුම් ලබාදීමට උත්සාහ කළ යුතුය. හානිපූරණය සුවපත් කිරීම සහ සංහිඳියාව ඇතිකිරීම සඳහා දායක විය හැකි බව මම තරයේ විශ්වාස කරමි.”



Stories on a String: තමන්ගේ කලා කෘතියේ කටයුතු ආරම්භ කරන කාන්තාවන්.



Laughing and learning: රූකඩ සංදර්ශනයක් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවක් ආරම්භ වන තුරු බලා සිටින ප්‍රජා කාන්තාවන්.



Continuing Thread: විවිධ ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් කාන්තාවන් තම කණ්ඩායමේ සාරිය කෙලෙස පින්තාරු කල යුතුදැයි සැලසුම් කිරීම ආරම්භ කරන අවස්ථාවක්.

සත්‍යය පිළිබඳ කොමිසමක් ඉදිරියේ මගේ අත්දැකීම බෙදා ගැනීමට හැකි නම් එය අගනේය. අද වන තුරු මටවත්,  මා දන්නා හඳුනන කිසිවෙකුටවත් මේ අවස්ථාව ලැබී නැත.

එසේම මේ රටේ නැවත යුද්ධයක් ඇතිවීම වැළැක්වීම සඳහා කුමක් කළ යුතුද යන්න පිළිබඳව මිනිසුන් සිතන්නේ කුමක්දැයි තේරුම් ගැනීමටද ඒය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. විශේෂ අධිකරණයක් ගැන මට එතරම් දැනුමක් නැති නමුත් ගැටුමට අදාළව මිනිසුන් පීඩාවට පත් කල ප්‍රචණ්ඩත්වය හා හිරිහැර කිරීම් සඳහා යුක්තිය ඉටු කිරීමට අවස්ථා හිමිවිය යුතුය.

## නීතිය නිසියාකාරව ක්‍රියාත්මක  කිරීම ද හානිපූරණයේ ආකාරයක් යැයි මම විශ්වාස කරමි.

නීති හා රෙගුලාසි පිළිබඳව අපට දැනුමක් තිබීම ද වැදගත් ය.

## මගේ සැමියා අතුරුදන් වූ බවට ලියවිල්ලක් මා සතුව නොතිබුණි.

වන්දි ඉල්ලා නඩුවක් පැවරීමට ද ඒ නිසා මා හට නොහැකි වී ඇත. අවසානයේ වවුනියාවේ ග්‍රාම නිලධාරීවරයෙක් මට ඔහු මිය ගිය බවට සහතිකයක් ලබා දුන්නේය. මම ඔහුගේ මළ සිරුර නොදුටු බැවින් ඔහු මියගිය බව මට විශ්වාස කළ නොහැක. නමුත් මගේ දියණිය පාසලට ඇතුළත් කිරීමේදී එම ලියවිල්ල අවශ්‍ය වනු ඇතැයි සිතා මම එම සහතිකය ලබා ගත්තෙමි.

අඩුම තරමින් මගේ සැමියාට සිදු වූයේ කුමක්ද සහ ඔහු අතුරුදන් වීමට වගකිව යුත්තේ කවුරුන්ද යන්න මට දැන ගත හැකිනම් එය මට මහත් සහනයක් වනු ඇත.





Sarees of hope: ප්‍රජා කාන්තාවන් තමන් විසින් පින්තාරු කළ සාරියකින් වැඩමුළුවේ පහසුකම් සපයන්නා හැඩගැන්වූ අවස්ථාවක්.



Learning through Play: මතකය මෙවලමක් ලෙස භාවිතා කරමින් කාන්තාවන් ඉතිහාසය ආවර්ජනය කරන අවස්ථාවක්.



වැඩමුළුවකදී තමන් ඉගෙන ගත් දේ පිළිබඳ කාන්තාවන් තම අදහස් හුවමාරු කර ගන්නා අවස්ථාවක්.



Intent Listening: කලාකෘතියක් සඳහා තම අදහස් සාකච්ඡා කරන තම කණ්ඩායමට සවන් දෙන කාන්තාවක්.

නීතිය නිසියාකාරව ක්‍රියාත්මක කළ යුතුයි.

**මම හිතන්නේ ගැටුම ඇතිවුනේ මිනිසුන්ට එක හා සමානව සැලකීම සිදු නොවූ නිසායි.**

මෙය නැවත සිදුවීම වැළැක්වීම සඳහා එය වෙනස් විය යුතු අතර රටේ නායකත්වය දෙමළ ප්‍රජාවගේ අදහස් ද විමසිය යුතුය. මම හිතන්නේ හානිපූරණය රට සුවපත් කිරීමට දායක වන බවයි.

(යාපනයේ ප්‍රජා කාන්තාවක්)



Mic Test One: කාන්තාවන් තම කලාකෘතිය තම සාමූහිකයට ඉදිරිපත් කිරීමට සූදානම් වේ.

මම මගේ පුතාගේ අතුරුදන් වීම ගැන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දැනුම් දී එය ලියාපදිංචි කර තිබෙනවා. මම හානිපූරණය ගැන අසා තිබුණත්, මේ දක්වා මා අත්විඳි පාඩුවට වන්දියක් මට ලැබී නැහැ.

**නමුත් අතුරුදන් වූ දරුවෙකුගේ අහිමි වීම වෙනුවෙන් ඔබට හානිපූරණය කළ හැකි යැයි මම නොසිතමි.**



මාතෘකාව පිළිබඳ තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා කලාකෘතියක් නිර්මාණය කිරීමට පෙර ප්‍රජා කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ හානිපූර්ණය පිළිබඳ සැසියකට සවන් දෙන අවස්ථාවක්.



මාතෘකාව පිළිබඳ කලාකෘතියක් නිර්මාණය කිරීම සඳහා කණ්ඩායම් වලට බෙදී යාමට පෙර ප්‍රජා කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ හානිපූර්ණය පිළිබඳ සටහන් තබාගැනීම සහ මෙනෙහි කිරීම සිදු කරයි.



Bringing Puppets to Life: හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ ඇතැම් සේවකයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන මාතෘකාව සහ එය ඔවුන්ගේ වැඩවලට අදාළ වන්නේ කෙසේදැයි ගවේෂණය කරමින් රූකඩ සෑදූ අවස්ථාවක්.

## “සිදු කර ඇති උල්ලංඝනයන් සඳහා ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා සිටිය යුතුය.

නමුත් මම හිතන්නේ, අපට සිදු වී ඇති දේ නිසා, සමාව දිය හැක්කේ අප මිය ගිය විට පමණක් බවයි. නමුත් සමාව ඉල්ලුවහොත් එය අපේ මනසට යම් තරමක සැනසීමක් ලබා දෙනු ඇත.”

“යුද්ධයේ අවසාන කාලයේදී අපේ ජනතාව බොහෝ දුක් වින්දා. එය අප මතක තබා ගැනීම වැදගත් වන අතර යුද්ධය හේතුවෙන් අප මුහුණ දුන් සහ දැනටත් මුහුණදෙන දුෂ්කරතා පිළිබඳව ජනතාව දැනුවත් වීම වැදගත්.

මෙහි සිටින සෑම කෙනෙකුම අනුස්මරණ දිනයක් තිබෙනවාට කැමතියි. ඔවුන්ට ළමා නිවාසවලට හෝ වැඩිහිටි නිවාසවලට ආහාර ලබා දීම ඇතුළු ඒ හා සමාන ක්‍රියාකාරකම්වල යෙදිය හැකිය. ජාතික මට්ටමින් මේ සඳහා නිශ්චිත දිනයක් වෙන් කළ යුතුයි.

## කෙසේ වෙතත්, අපේ ප්‍රජාවෙන් පිටත දී මේ ගැන කතා කිරීමට අපට අපහසුය. ඒසේ කිරීමට අපට බියක් දැනෙනවා.”

හානිපූර්ණය සඳහා වන කාර්යාලය පිහිටුවා ඇති බව මම නොදැන සිටියත් එවැනි වැඩ වැදගත් යැයි මම විශ්වාස කරමි. විශේෂයෙන් ගැටුම් හේතුවෙන් අසරණ වූ සහ තනිකඩව තම පවුල් නඩත්තු කිරීම සඳහා අඛණ්ඩව සටන් කරන බොහෝ පුද්ගලයෝ සිටිති.

ඔවුන්ගේ වර්තමාන අවශ්‍යතා සහ දුෂ්කරතා මට්ටම අනුව වන්දි සහ ප්‍රතිලාභ ලබා දීම සඳහාහානිපූර්ණය සඳහා වන කාර්යාලය කටයුතු කිරීම වැදගත් ය.

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

හානිපූරණ ප්‍රතිපත්තියක් මඟින් කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලිය යුතු අතර ඇතැම් විට ඔවුන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු යැයි ද මම විශ්වාස කරමි. එයට හේතුව වාර්ගික භේදයකින් තොරව සෑම අවස්ථාවකදීම සහ තම පවුල් රැක බලා ගැනීමේදී වැඩිපුරම පීඩා විඳින්නේ කාන්තාවන් වන බැවිනි.

**හානිපූරණ ප්‍රතිපත්තියක් සැකසීමේදී කාන්තාවන්ද ඇතුළත් කළ යුතුය, මන්ද කාන්තාවන්ගේ ගැටළු තේරුම් ගත හැක්කේ කාන්තාවකට පමණක්ම වන බැවිනි.**

- කාන්තා ප්‍රජා නියෝජිත, හම්බන්තොට





Conceptual Roadblock: කාන්තාවන් හා හානිපූර්ණය පිළිබඳව කලාකෘති සැලසුම් කිරීමේ අවධියේදී කාන්තාවන් වැඩමුළුවේ පහසුකම් සපයන්නාගෙන් උපදෙස් ලබා ගන්නා අවස්ථාවක්.



Take Note: හානිපූර්ණය පිළිබඳ තමන්ගේ අදහස් ප්‍රකාශ කරන තම කලාකෘති සඳහා වූ අදහස් සහ සැලසුම් සටහන් කරගන්නා කාන්තාවන්.



Cross Cultural Communication: කලා කෘතියක් නිර්මාණය කිරීමේ සැලසුම් අවධියේදී තම කණ්ඩායම සමඟ අදහස් හුවමාරු කර ගන්නා කාන්තාවන්.



Building a case: කාන්තාවන් සහ හානිපූර්ණය පිළිබඳ ඔවුන්ගේ කලාකෘති සැලසුම් කිරීම අතරතුර කාන්තාවක් තම කණ්ඩායම සමඟ අදහස් බෙදා ගන්නා අවස්ථාවක්.

> "නැවත යුද්ධයක් ඇති නොවිය යුතුය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා රජය සත්‍යය තහවුරු කර, නැවත යුද්ධයක් ඇති නොවීම සහතික කිරීම සඳහා අපගේ ගැටලුවලට විසඳුම් ලබා දිය යුතුය."

- කාන්තා ප්‍රජා නියෝජිත, මඩකලපුව

> "හානිපූරණය තුළින් මගේ ස්වාමිපුරුෂයා ආපසු ගෙන ඒමට නොහැකි නමුත් මගේ දරුවන් හොඳ අධ්‍යාපනයක් ලබා සුවපහසු ජීවිතයක් ගත කරන බව දැන අවම වශයෙන් මට සාමකාමී හැඟීමක් ලබා ගත හැකිය.
>
> මට තවත් යුද්ධයකට මුහුණදීමට අවශ්‍ය නැති අතර මෙය සහතික කර ගැනීම සඳහා අපි සාමය හා සංහිඳියාවට හිතකර ආකල්පයක් වර්ධනය කර ගත යුතුයි."

- කාන්තා ප්‍රජා නියෝජිත, මඩකලපුව

නිවස තැනීමට සහ රැකියාවක් ලබාගැනීමටත්, මගේ පුතාට වෛද්‍ය ආධාර සහ රැකියාවක් ලබා ගැනීමටත් අවශ්‍ය සහාය මම බලාපොරොත්තු වෙමි.

ඉඩමක් මිලදී ගැනීම සඳහා මම මුදල් වන්දි ඉල්ලා සිටිමි.

මගේ ජීවිතයේ අවසාන කාලයේදී මම ඉල්ලන්නේ කුඩා නිවසක ජීවත් වීමටයි.

මගේ ජීවිතය පවත්වාගෙන යාමට මට මාසික ආදායමක් අවශ්‍යයි. මම අසනීපව සිටින බැවින් මට වෛද්‍ය ආධාර අවශ්‍යයි.

හානිපූරණය දිගු කාලීන විය යුත්තේ අපට මුළු පවුලම රැකබලාගන්නා අතර අපගේ අවශ්‍යතා ද තෘප්තිමත් කර ගත යුතු බැවිනි.

දිගු කාලීන හානිපූරණය යනු මුදල් වන්දි ගෙවීම පමණක් නොවේ - නිවසක් ලබා දෙනවා නම් එය ද දිගු කාලීනය. වෙනත් හානිපූරණ දිගු කාලීන හෝ කෙටි කාලීන විය හැකිය. ක්ෂුද්‍ර ණය සේවා වලට වඩා, ගෙදර සිට වැඩ කිරීමෙන් ආදායමක් උපයා ගැනීමට රජයට මට උදව් කළ හැකි නම්, උදාහරණයක් වශයෙන් ප්‍රයෝජනවත් වන යන්ත්‍රයක් ලබා දීම. දිගු කාලීනව සැපයෙන මනෝ සමාජීය ආධාර වැනි පුනරුත්ථාපන හානිපූරණ ද බලාපොරොත්තු වේ. නීති ප්‍රතිසංස්කරණ ද ප්‍රයෝජනවත් වනු ඇත.





Contemplation: ඔවුන්ගේ කලා කෘතිය සැලසුම් කරන තම කණ්ඩායමට සවන්දෙන කාන්තාවක්.

Cut Flowers: තම කණ්ඩායමේ කලාකෘතිය සඳහා රෙද්දක ඇති මුද්‍රිත මල් මෝස්තර කපමින් සිටින කාන්තාවක්.



'බලාපොරොත්තුව සහ ඔරොත්තු දීමේ හැකියාව' - කලාකෘතියේ නිමැවුම්කරුවන්

අතුරුදන් වූ දරුවා පිළිබඳ තොරතුරු ලබා දිය යුතුය. අතුරුදන් වූ මගේ දරුවා වෙනුවෙන් වන්දි ලබා ගැනීමට මම කැමති නැහැ. නමුත් දේපල අහිමි වීම සම්බන්ධයෙන් මාසික දීමනා ලබා දිය යුතුයි.





Partners in Twine: තම කලාකෘතිය නිර්මාණය සඳහා නිහඬව කාඩ්බෝඩ් වටා එවයින් නූල් ඔතමින් සිටින කාන්තාවන්.

Muted Expressions කාන්තාවන් විසින් මුහුණ දෙන සමාජ සීමාවන් සන්නිවේදනය කිරීම සඳහා තම කලාකෘතිය වශයෙන් භාව ප්‍රකාශය රහිත රුවක් සකසන අවස්ථාවක්.



The ‘eyes’ have it: තම කලා කෘතියේ කොටස් එකතු කරමින් සිටින කණ්ඩායමක්.

සමාව ඉල්ලීම, ස්මාරක ගොඩනැගීම, ස්මරණය සඳහා දින වෙන් කිරීම, අතුරුදන්වූවන්ට සිදු වූයේ කුමක්දැයි සොයා බැලීම.

Sharing Experiences: සාරි පින්තාරු කිරීමේ වැඩමුළුවකදී කාන්තාවෝ තම අනාගත බලාපොරොත්තු සහ ප්‍රාර්ථනාවන් පිළිබඳ අදහස් බෙදා ගනිති.



කාන්තාවන්ට තමන් විසින් මුහුණ දුන් උල්ලංඝනයන් පිළිබඳ සාකච්ඡා කිරීමට ආරක්ෂිත ඉඩක් ලෙස හඳුනාගන්නා ස්ථානයක් [සංකේතාත්මක හානිපූරණය] ද බලාපොරොත්තු වන හානිපූරණයකි.

ඒ ගමේ හිටපු අපි හැමෝටම අපේ දේපල අහිමි වුණා. අපට සිදු වූ අලාභය සඳහා අපි සියලු දෙනාටම වන්දි ගෙවිය යුතුයි.

අපේ ගමෙන් ඉවත් වීමට සිදුවූ අප සියලු දෙනා වෙනුවෙන් ගමේ ස්මාරකයක් ඉදි කළහොත් හොඳයි. දැන් ඒ ගමේ අලුත් මිනිස්සු පදිංචි වෙලා. මම මෑතකදී ඒ ගමට ගියා. නමුත් එය අපේ ගම සහ ඒ ගමෙන් අපට යන්න වුණ බව හඳුනා ගැනීමට ස්මාරකයක් එහි නෑ. මට ඒ ගැන ලොකු දුකක් දැනුනා. අපිට ඒ ගමට අයිතියක් ඇති බවත්, එහි මතකයන් ඇති බවත් සිහිපත් වන විට මට දුක හිතුණා.

ඇත්තෙන්ම එම ආයතන වල නිලධාරීන්ට (රජයේ නිලධාරීන්ට) එම පුහුණුවීම් අපට වඩා අවශ්‍යයි. ඔවුන් අපට ඉතාමත් නරක විදියටයි සලකන්නේ – කෙසේ හැසිරිය යුතු දැයි අදහසක් නැත්තේ ඒ අයටයි.

- කාන්තා ප්‍රජා නියෝජිත, කිලිනොච්චිය

යුද්ධය බලපෑවේ දෙමළ කාන්තාවන්ට පමණක් බව බොහෝ දෙනා සිතයි, නමුත් සිංහල කාන්තාවන් ද ඉන් පීඩාවට පත් වූහ. අයිතිවාසිකම් උල්ලංඝනය වූ සිංහල කාන්තාවන් ගැන කිසිවෙකු කතා නොකරයි.


- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම

මානව හිමිකම් හෝ මූලික අයිතිවාසිකම් ගැන කතා කරන විට ඒ ගැන වඩාත් දැනුවත්ව සිටින්නේ කාන්තාවන් ය. නමුත් කාන්තාවන්ට එළියට යාමට නිදහසක් නැත. කාන්තාවන්ට එළියට යාමට පවා පිරිමින්ගේ අවසරය අවශ්‍යයි.

- කාන්තා ප්‍රජා නියෝජිත, පුත්තලම



Behind the Scenes: තම කලාකෘතිය ඉදිරිපත් කිරීමට පෙර කණ්ඩායමේ සගයන් අතර අදහස් හුවමාරු කරගන්නා අවස්ථාවක්.



Pieces of a whole: සිවිල් සමාජ සංවිධාන සඳහා වන වැඩමුළුවකදී අයිතිවාසිකම් පිළිබඳ ගවේෂණය කිරීම.



A brief moment of entertainment: කාන්තාවන් තම අයිතිවාසිකම් පිළිබඳව වන රූකඩ ප්‍රසංගයක් නැරඹීම සඳහා එක් වේ.

**යුද්ධය නිසා බොහෝ කාන්තාවන් ගෘහ මූලිකයන් බවට පත් වී ඇත. ඔවුන්ගේ මූලික ජීවනෝපාය සඳහා මුදල් රැස් කිරීමේදී ඔවුහු  බරපතල ගැටලුවලට මුහුණ දෙති.**

හානිපූරණ ක්‍රියාවලියක් සඳහා කාන්තාවන් එලෙස ඉලක්ක කර ගැනීම වැදගත් ය. සමහර වැඩසටහන් ආරම්භ කර ඇතත්, සෑම කෙනෙකුටම එම වැඩසටහන් වලට ප්‍රවේශය හෝ ඒවායින් ප්‍රතිලාභයක් නොමැත.

ගැටුම හේතුවෙන් බොහෝ කාන්තාවන්ගේ අධ්‍යාපනය අහිමි වී ඇත. බොහෝ දෙනෙක් ගෘහ මූලිකයන් බවට ද පත් වී ඇත. හානිපූරණය මගින් මෙම කාන්තාවන්ට ප්‍රමුඛතාවය දිය යුතුය.

**කාන්තා ගෘහ මූලිකයන්ට ලබාදෙන හානිපූරණයන් පිරිමි ගෘහ මූලිකයන්ට ලබාදෙන හානිපූරණයන්ට සමානද නැතිනම් අපේ විවිධ ගැටළු හඳුනාගනු ඇත්ද යන්න පිළිබඳව අපට ප්‍රශ්න තිබේ.**

**හානිපූරණයන් මගින් අතුරුදන් වීම සහ අවතැන් වීම පිළිබඳ ගැටළු වලට සෘජුවම විසඳුම් සෙවිය යුතුයි.**

අපි හානිපූරණය ගැන කතා කරන විට මිනිස්සු ක්ෂණිකව මුදල් ගැන සිතති. හානිපූරණය ඊට වඩා පුළුල් දෙයක් බව අප පැහැදිලි කළ යුතුයි.



Pointed Questions: කාන්තාවන්ගේ පෙර නොඇසූ විරූ විවිධාකාර විමසීම් රෙද්දක යන්තමින් සවි කර ඇති විවිධ වර්ණයෙන් යුත් අල්පෙනෙති මගින් නිරූපණය වන ලෙස සැකසූ කලාකෘතියක්.



Resilience and Hope: ශ්‍රී ලංකාව තුළ හානිපූරණයන් ඉල්ලා සිටින සහ තවමත් අසංතෘප්තව සිටින අයගේ බලාපොරොත්තු නිරූපණය  කරන නිර්මාණයක්.



A Quick Chat: සංස්කෘතික වශයෙන් විවිධ පසුබිම් වලින් පැමිණෙන කාන්තාවන් තම කලාකෘති ගොඩනගන අතරතුර සතුටු සාමීචියේ යෙදෙන මොහොතක්.



Teamwork: විවිධ සංස්කෘතික පසුබිම්වල කාන්තාවන් එක්ව කලා නිර්මාණ කටයුතු සිදු කරන අවස්ථාවක්.

## කාන්තාවන් බොහෝ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට මුහුණ දී තිබේ. මුස්ලිම් කාන්තාවන් අත්විඳින බොහෝ හානි සැඟවී පවතී. යුක්තියක් හෝ සහනයක් නැත.

මෙම කාන්තාවෝ මූලික ද්‍රව්‍යමය අවශ්‍යතා සමඟ පොරබදමින් සිටිති. මියගිය කෙනෙකුගේ අහිමි වීම, යුද්ධය හේතුවෙන් ආබාධිත වීම, මානසික කම්පනය සඳහා ද හානිපූරණය කළ යුතුය. හානිපූරණය ගැන බොහෝ රැස්වීම් පවත්වා ඇතත් තවමත් කිසිවක් සිදුවී නොමැත. අවශ්‍යතා මත හානිපූරණය තක්සේරු කළ යුතුය. මේ මොහොතේ, ලොකුම අවශ්‍යතාවය ද්‍රව්‍යමය ය  - විශේෂයෙන් කොවිඩ් -19 න් පසු රැකියාවට යාමට නොහැකි කාන්තාවන්ට මෙය අදාළ වේ. ඔවුන්ගේ වැදගත්ම අවශ්‍යතාවය වන්නේ සංවර්ධනය සහ ජීවනෝපායයි.

## යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවෝ තවමත් ෂෙල් වෙඩි වලින් බියටත්, කම්පනයටත් පත් වෙති. ඔවුන්ට කම්පන උපදේශනය අවශ්‍යයි.

අවතැන් වීම හේතුවෙන් වසර 10 ක පමණ කාලයක් අධ්‍යාපනයක් අහිමි වී ඇත - ඔවුන්ට දැන් ඉගෙනීමට නොහැකි වී ඇති අතර අපට ඔවුන්ට අධ්‍යාපනය ලබා දිය නොහැකිය. ඔවුන් ඉගෙන ගත්තා නම් ඔවුන්ට සමාජයේ වැඩ කිරීමට හැකියාව තිබුණි. රජය එම අයිතිය ලබා දිය යුතුයි - වෘත්තීය පුහුණුව ලබා දී ඔවුන්ට වැඩ කිරීමට හා උපයා ගැනීමට හැකියාව ලබාදිය යුතුයි.

**දේශපාලන තත්ත්වය ද වෙනස් වෙමින් පවතී. මෙම සන්දර්භය තුළ සාකච්ඡා කර විසඳුම් සඳහා එකඟ වීම සඳහා මිනිසුන් එකතු කිරීම ද ඉතා අසීරු ය.**

1983 සිට බොහෝ දේ සිදු වී ඇති නමුත් කලින් සිදු වූ අලාභය පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට දැන් අපට නොහැකි වී ඇත (අතුරුදන් වූ දරුවන්/ අතුරුදන් වූ අය). ඉඩම් අහිමි වූ ජනතාව තවදුරටත් එහි නැත. අම්පාරෙන් අවතැන්වූ ජනතාව සඳහා එතරම් ලියකියවිලි නොමැති අතර, ඔවුන් එහි සිටියදී පවා ඒවා දෝෂ සහිත විය. මෙහි දී කියවෙන කතාව නම් යුද්ධයක් තිබුණේ නෑ, කිසිවක් සිදු වුනෙත් නෑ යන්නයි.

**එක් අභියෝගයක් නම්, අප ගොස් උප්පැන්න සහතික ඉල්ලූ විට, අපි කවුදැයි ඔප්පු කරන ලෙස ඔවුන් අපට පැවසීමයි.**

යුද්ධයේදී අපට එම දත්ත බොහෝමයක් අහිමි විය. දැන් අපි හානිපූරණය ලබාගැනීම වැනි දෙයක් සඳහා ගියහොත් ඔවුන් අපෙන් එයම ඉල්ලනු ඇත - එවිට අප කුමක් කළ යුතුද? ප්‍රමාණවත් ලියකියවිලි නොමැතිකම ඇත්තටම ගැටලුවක්.

**මිනිස්සු දැන් ගිහින් දේවල් අහන්න බයයි. ඔවුන් කියනවා මම අතුරුදන් වීම ගැන කතා කළොත් මමත් අතුරුදන් වෙයි කියලා.**

අතුරු සහන සැලැස්ම ගැන දැනගැනීමට දැන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත මිනිසුන් නොපැමිණීමට එය එක් හේතුවක්.



Quick Refresher: කාන්තාවන් තම කලාකෘතිය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන තෙක් තමන් විසින් ඉදිරිපත් කිරීමට යන කරුණු සූදානම් කරගනිමින් සිටින අවස්ථාවක්.



Deep thought: කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ කලාකෘති සැලසුම් කිරීම සඳහා කාන්තාවන් කණ්ඩායම් වැඩ වල නිරත වන අවස්ථාවක්.



Thoughtful Consideration: කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිය කලාකෘති සැලසුම් කිරීමේදී තම කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද අදහස් සම්බන්ධයෙන් ගැඹුරින් විමසා බලන අවස්ථාවක්.

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය

325 A 1, තිඹිරිගස්යාය පාර, කොළඹ

+94 11 2055404

srilanka.cej@gmail.com

http://cejsrilanka.org/

/Centre-for-Equality-and-Justice

/cej_srilanka/

/CEJ_SriLanka

/CEJ Sri Lanka